# පළවෙනි සභාපතිත්වයේ සහ බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ, මැයි 2013

# පළවෙනි සභාපතිත්වයේ පණිවුඩය, මැයි 2013

## කීකරුකම ආශිර්වාද ගෙනඑයි

**සභාපති තෝමස් එස්. මොන්සන් විසිනි**

සත්‍යය අවබෝධය සහ අපගේ බලවත්ම ප්‍රශ්නවලට පිළිතුරු අපට ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ පණත්වලට අප කීකරුවන විටය,

මා ආදර සොයුරු සොයුරියනි, මේ උදෑසන ඔබ සමග සිටීම ගැන මා කෙතරම් කෘතඥවන්නේද. ඔබ ඇමතීමේ වරප්‍රසාදයට ප්‍රතිචාර දක්වන විට, ඔබගේ ඇදහිලිමත් යාච්ඤාවේ සැලකිල්ල මම බලාපොරොත්තුවෙමි.
යුග ගණනාවක් තුල, මිනිසුන් සහ කාන්තාවන් මෙම මැරෙනසුළු ජීවිතයේ පැවැත්ම සහ එහි ඔවුන්ගෙ ස්ථානය සහ අරමුණ මෙන්ම, සමාදනය සහ සතුටට මාර්ගය සම්බන්ධවද අවබෝධය සහ තේරුම්ගැනීම සොයන ලදී. අප හැම කෙනෙක්ම බාරගෙන තිබෙන්නේ එවැනි සෙවීමකි.
මෙම අවබෝධය සහ තේරුම්ගැනීම සියලු මනුෂ්‍යවර්ගයාට ලබාගත හැකිය. එහි සදකාලික සත්‍යයන් අඩංගු. දහම සහ ගිවිසුමේ, 1වෙනි කොටසේ, 39වෙනි පදයේ, අපි මෙසේ කියවමු: බලන්න, තවද බලන්න, ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ වන අතර, ආත්මයාණන් සාක්ෂිදරනසේක, තවද වාර්ථාව සත්‍යයය. සත්‍යය සදකාලයෙන් සදකාලයට පවතින්නේය
කිවියෙක් මෙසේ ලිවීය:
ස්වර්ග ඉවත්ව ගොස්, පොළොවේ උල්පත් පුපුරාගියද,
සත්‍යය, පැවැත්ම, කාලගුණය නරකට හැරුනද,
සදකාලය වෙනස්නොවේ, සදකල්හිම. 1
සමහරු මෙසේ ඇසිය හැකිය, “එවන් සත්‍යයක් සොයාගත හැක්කේ කොහෙන්ද? අප එය හඳුනාගන්නේ කෙසේද?” 1833 මැයි මාසයේදී කර්ට්ලන්ඩ්, ඔහයියෝ, අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් තුලින් දුන් එළිදරව්වක් තුලින්, ස්වාමීන්වහන්සේ මෙසේ කීසේක:
සත්‍යය යනු යම් දේවල් දැන් තිබෙන අන්දම, ඒවා තිබූ අන්දම සහ මතුවට ඒවා තිබෙන අන්දම ගැන අවබෝධයයි … සත්‍යයේ ආත්මය දෙවියන්වහන්සේගෙනි. …
යම් මිනිසෙක් තමාගේ පණත් නොතබන්නේද ඔහුට සම්පූර්ණත්වය ලැබෙන්නේ නැත.
දෙවියන්වහන්සේගේ පණත් තබන්නා, සත්‍යයෙන් මහිමවත්වී සියල්ල දැනගන්නා තුරු සත්‍යය සහ ආලෝකය ලබන්නේය. 2
කෙතරම් මහිමාන්විත පොරොන්දුවක්ද? දෙවියන්වහන්සේගේ පණත් තබන්නා, සත්‍යයෙන් මහිමවත්වී සියල්ල දැනගන්නා තුරු සත්‍යය සහ ආලෝකය ලබන්නේය.
සුභාරංචියේ පූර්ණත්වය නැවත පිහිටුවා තිබෙන මෙම දියුණුවන කාලයේ, සත්‍යය සොයමින්, සිතියම්ගත නොකළ සාගරවල යාම හෝ සලකුණු නොකල මාර්ගවල යාම හෝ ඔබට සහ මට අවශ්‍ය නැත. ප්‍රේමනීය ස්වර්ගික පියාණන් අපගේ මාර්ගය ලකුණුකර ඇති අතර නිවැරදි මගපෙන්වීමක් — *කීකරුකම* පවා ලබාදී ඇතිසේක. සත්‍යය ගැන අවබෝධයක් සහ අපගේ බලවත්ම ප්‍රශ්නවලට පිළිතුරු පවා, දේව පණත්වලට අප කීකරුවන විට ලැබෙන්නේය.
අපගේ ජීවිත කාලය මුළුල්ලේම කීකරුකම අපි ඉගෙනගන්නෙමු. අපි ඉතා බාලකාලයේ සිට පටන්ගෙන, අපව බලාගැනීම ගැන වගකිවයුතු අය අපගේ ආරක්ෂාව සහතිකකිරීමට උපදෙස් සහ නීති පනවති. එම නීතිවලට සම්පූර්ණයෙන්ම කීකරුවන්නේ නම්, අප සියලුදෙනාටම ජීවිතය සරලවනු ඇත. අපගෙන් බොහෝ දෙනෙක, කෙසේවුවද, කීකරුවීමේ ප්‍රඥව අත්දැකීම් තුලින් ඉගෙනගනිති.
මා වැඩෙන විට, ජූලි මුල සිට සැප්තැම්බර් මුල දක්වා. මගේ පවුල නැවතී සිටියේ ප්‍රෝවෝ කැන්යොන්, යුටා වල විවියන් පාර්ක් අපේ කුටියේය.
කැන්යොන්වල එම නිදහස්ව සිටි ඒ කාලයේ මගේ හොඳම මිතුරෙක් වූයේ ඩැනී ලාසන්ය, ඔහුගේ පවුලටද විවියන් පාර්ක්හි කුටියක් තිබ්න. හැම දිනකම ඔහු හා මම මෙම ළමා පාරාදීසයේ රවුම් ගසමින්, ජලාශවල සහ ගංගාවල මාළු අල්ලමින්, ගල් සහ වෙනත් වස්තූන් එකතුකරමින්, ඇවිදිමින්, කඳු නගිමින් හැම මිනිත්තුවක්ම, හැම පැයක්ම හැම දිනයක්ම විනෝද වුනෙමු.
එක් උදෑසනක ඩැනී සහ මම තීරණය කල පරිදි එදින සවස අපගේ කැන්යොන් මිතුරන් සියලුදෙනාම සමග කඳවුරක් පැවැත්වීමට අපට අවශ්‍යවිය. අප සියලුදෙනාටම එකතුවීමට හැකි පරිදි අසල පිහිටි පිට්ටනියක ප්‍රදේශයක් එළිකිරීම අපට අවශ්‍යව තිබ්න. එම පිට්ටනිය වැසී තිබුන ජූනි තණකොල වියලි සහ ඇනෙන සුළු නිසා, පිට්ටනිය අපට සුදුසු නොවන ලෙස සකස්වී තිබ්න. අපි උස තණ කොල ගලවා දැමීමට පටන්ගෙන, විශාල රවුම් ප්‍රදේශයක් ශුද්ධකිරීමට සැලසුම් කළෙමු. අපි මුළු ශක්තියෙන් අදිමින්, ගලවමින් සිටියත්, අපට ශුද්ධකිරීමට හැකිවුනේ මුරණ්ඩු වල්පැලෑටි කිහිපයක් පමණි. මේ වැඩේට මුළු දවසම යන බව අපි දැනසිටි අතර, දැනටමත් අපේ ශක්තිය සහ උනන්දුව පිරිහෙමින් තිබ්න.
තවද එවිට මගේ අට හැවිරිදි මොළයට ශ්‍රේෂ්ඨ විසඳුමක් ලැබුනු බව මම සිතුවෙමි, ඩැනී ඇමතු මම, “අපි දැන් කල යුත්තේ මෙම වල්පැලවලට ගිනි තැබීමයි, අපි වල් පැල රවුමක් ලෙසට පුච්චමු!” යයි කීවෙමි. ඔහු ක්ෂණිකව එකඟවූයෙන් මම ගිනිකූරු ටිකක් ගෙන ඒමට අපේ කුටිය වෙතට දිව ගියෙමි.
අට හැවිරිදි වියේ සිටි අපට ගිනි කූරු පාවිච්චිකිරීමට ඉඩදුන්නායයි ඔබ කිසිවෙක් සිතන්න එපා, ඩැනීට සහ මටද වැඩිහිටියන්ගේ පරීක්ෂාවෙන් තොරව ඒවා පාවිච්චිකිරීම තහනම්ව තිබූ බව මා පැහැදිළිව කිව යුතුයි. ගින්දරවල භයානකකම ගැන අප දෙදෙනාට කිහිපවරක්ම අවවාදකර තිබුනි, කෙසේවුවද මගේ පවුලෙ අය ගිනි කූරු තියන තැන මම දැනසිටි අතර පිට්ටනිය එළිකිරීම අපට අවශ්‍ය තිබ්න. දෙපාරක් නොසිතා මම අපේ කුටියට දිව ගොස් අළුත් ගිනිකූරු ටිකක් අරගත්තෙමි. කිසිවෙක් බලා නොසිටින බව දැනගෙන ඒවා මගේ සාක්කුවක් තුලට දැම්මෙමි.

අපේ ප්‍රශ්නයට විසඳුම මගේ සාක්කුවේ ඇති බවට සතුටින් මම ඩැනී වෙතට නැවත දිව්වෙමි. මා සිතුවේ ගින්න අපට අවශ්‍ය කොටස පමණක් පුච්චා ඉතිරි හරිය මැජික් එකකින් නිවා දමනු ඇතැයි කියාය.

මම ගිනිකූරක් ගලක ගසා ජූනි තණකොලවලට ගිනි තැබුවෙමි. එය ගිනිගත්තේ හරියට ගැසලින්වලින් පොඟවා තිබූ ලෙසය. මුලින් ඩැනී සහ මම ත්‍රාසයට පත්වුනේ බලා සිටියදී වල් පැල නැතිවී යන නිසාය, නමුත් පෙනීමට තිබුනේ ගින්දර ඉබේම නිවී යන්නේ නැති බවය. එය නැවැත්වීමට අපට කළ හැකි දෙයක් නැති නිසා අපි බියට පත්වුනෙමු. භයානක ගිනිදැල් කඳුකරයේ කැලෑ තණකොලවලට පවා ඇවිලීයාමට පටන්ගත්තේය. එම මාර්ගයේ තිබෙන පයින් ගස් සහ සෑම දෙයක්ම අනතුරට ලක්විය.

අවසානයේදී උදව් සොයා දිවයනු මිස අපට වෙනත් විකල්පයක් නොවීය. ඉක්මණින්ම විවියන් පාර්ක් එකේ සිටි මිනිස්සු සහ කාන්තාවෝ එහාට මෙහාට පනිමින් තෙත ගෝනි බෑග් වලින් ගින්දරට ගසමින් එය නිවාදැමීමට තැත්කළහ. පැය කිහිපයකට පසුව, ඉතිරි ගිනි අඟුරුද නිවී ගියේය. ගින්න පැතිරී යාමට ඉඩ තිබූ නවාස මෙන් පැරණි පයින් ගස්ද ඉතිරිවිය.

ඩැනී සහ මම බොහෝ අසීරු එහෙත් වැදගත් පාඩම් කිහිපයක් එද ඉගෙනගත්තෙමු— කීකරුකමේ වැදගත්කම ඒ එකකවත් අඩු නොවීය.

අපගේ ශරීරයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කොන්දේසි සහ නීති ඇත. එපරිදි, අපේ ආත්මික ආරක්ෂාව සහතික කිරීමට ස්වාමීන්වහන්සෙ උපදෙස් සහ පණත් ලබාදී ඇතිසේක. එනිසා අපට නිතර අවිශ්වාස මෙම මැරෙනසුළු ජීවිතය සාර්ථකව යාත්‍රාකර අවසානයේදී අපගේ ස්වර්ගික පියාණන් වෙත නැවත යා හැකිය.

ශතවර්ෂ ගණනාවකට පෙර, සම්ප්‍රදායක් ලෙස සතුන් බිලිපූජාකිරීමේ පරම්පරාවකට සාමුවෙල් නිර්භීතව මෙසේ කීවේය: "පූජාවට වඩා කීකරුවීමත්, බැටළුවාගේ තෙලට වඩා ඇහුම්කන්දීමත් හොඳය."[3]

මෙම කාලපරිච්ඡේදයේදී, ස්වාමීන්වහන්සේ අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත්ට එළිදරව්කරමින්, උන්වහන්සේට අවශ්‍ය, කැමැත්ත ඇති හදවතක් සහ මනසකි. තවද කැමති අය සහ කීකරුවන අය මෙම පසු-දවස්වලදී දේශයේ යහපත අනුභවකරන බවද කීසේක.4

සියලු අනාගතවක්තෘවරු, පැරණි සහ නූතන, අපගේ ගැලවීමට කීකරුකම අත්‍යාවශ්‍යබව දැන සිට ඇත. නෙපී මෙසේ කීවේය, "මම ගොස් ස්වාමීන්වහන්සේ මට ආඥකළ දේ කරන්නෙමි" 5

අන් අය ඔවුන්ගේ ඇදහිල්ලෙන් සහ ඔවුන්ගේ කීකරුකමින් පැකිලුනද, නෙපී කිසි විටෙක ස්වාමීන්වහන්සේ ඔහුට පැවසූ කිසිවක් කිරීමට අසමත් නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස, පරම්පරා අප්‍රමාන ගණනාවක් ආශිර්වාදිතවී ඇත.

කීකරුකම ගැන ආත්මය කැළඹෙන විස්තරයකි ආබ්‍රහම් සහ අයිසෙක්. එය ආබ්‍රහම්ට කෙතරම් වේදනාත්මක අසීරු එකක්විය හැකිද, දේව නියෝගයට කීකරුවී, ඔහුගේ ආදරණීය අයිසැක් රැගෙන බිලිපූජාවක් ලෙස පිරිනැමීමට ඔහු මොරියා දේශයට ගියේය. ආබ්‍රහම් නියමකළ තැනට ගමන්කරන විට, ඔහුගේ හදවතේ බර ගැන ඔබට සිතාගත හැකිද? ඔහු අයිසැක්ව බැඳ, ඔහුව අල්තාරය මත තබා, ඔහුව මැරීමට පිහිය ගත් විට නිසැකවම දැඩි වේදනාව ඔහුගේ ශරීරය විනාශකර ඔහුගේ මනසට වධදෙන්ට ඇත. නොසැලෙන ඇදහිල්ල සහ ස්වාමීන්වහන්සේ තුල සම්පූර්ණ විශ්වාසය සහිතව ඔහු, ස්වාමීන්වහන්සේගේ නියෝගයට ප්‍රතිචාර දැක්වීය. එම ප්‍රකාශනය සහ ඒ සමග පැමිණි පුදුමාකාර පිළිගැනීම කෙතරම් මහිමාන්විතද: "නුඹේ අත තරුණයා පිට නොතබව, ඔහුට කිසිවක් නොකරව. මක්නිසාද, නුඹේ පුත්‍රයා, නුඹේ එකම පුත්‍රයා, මාගෙන් නොවැළැක්වූ බැවින් නුඹ දෙවියන්වහන්සේට භයවෙන බව දැන් දනිමි. "6

ආබ්‍රහම්ව පරීක්ෂණයකර පරීක්ෂාකර ඇත, ඔහුගේ ඇදහිලිමත්බව සහ කීකරුකම සඳහා දෙවියන්වහන්සේ ඔහුට මහිමාන්විත පොරොන්දුවක් දුන්සේක: "මාගේ ශබ්දයට නුඹ කීකරුවූ නිසා, නුඹේ වංශය කරණකොටගෙන පොළොවේ සියලු ජාතීහු ආශිර්වාද ලබන්නෝය. 7

අපගේ කීකරුකම ඔප්පුකරීමට එවැනි නාට්‍යාකාර ලෙස සහ හදවත ඇඹරෙන ලෙස අපගෙන් ඉල්ලා නොතිබුනද, කීකරුකම අපගෙන්ද අපේක්ෂා කෙරේ.

සභාපති ජෝසෆ් එෆ්. ස්මිත් 1873 ඔක්තෝබර් මස මෙසේ කීවේය, "ස්වර්ගයේ පළවෙනි නීතිය කීකරුකමයි.8

සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි මෙසේ කීවේය, "පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ සතුට, පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ සමාදනය, පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ දියුණුව, පසු-දවස්වල ශුද්ධවන්තයන්ගේ සමෘද්ධිය, සහ මෙම ජනතාවගේ සදකාලික ගැලවීම සහ උත්කර්ෂය පවතින්නේ දෙවියන් වහන්සේගේ උපදේශයන්ට කීකරුව සිටීම … තුලය."9

කීකරුකම වනාහි අනාගතවක්තෘවරුන්ගේ සළකුණයි; එය ගතවූ යුග මුළුල්ලේම ඔවුන්ට ශක්තිය සහ අවබෝධය ලබාදී ඇත. අපද, මෙම ශක්තිය සහ අවබෝධය ලබාදෙන මූලාශ්‍රයට සුදුසුබව අවබෝධකරගැනීම අපටද අත්‍යාවශ්‍යවේ. අප දේව නියෝගවලට කීකරුවන විට, එය අද අප හැමකෙනෙකුටම පහසුවෙන් ලබාගැනීමට හැකිය.

ගතවූ වසර මුළුල්ලේම, විශේෂයෙන්ම මා දැන සිටි ඇදහිලිමත්, සහ කීකරු පුද්ගලයන් ගිණිය නොහැකි ගණනාවක් ඇත. ඔවුන් මගින් මම ආශිර්වාදිතවී ප්‍රබෝධමත්වීමි. එවන් පුද්ගලයන් දෙදෙනෙකු ගැන මම විස්තරයක් කරමි.

වෝල්ටර් ක්‍රෝස් සභාවේ නොසැලෙන සාමාජිකයෙක් විය, ඔහු සිය පවුල සමග, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව නැගෙනහිර ජර්මනිය ලෙස හැඳින්වූ ප්‍රදේශයේ ජීවත්විය. ඒ කාලයේ ලෝකයේ එම ප්‍රදේශයේ තිබූ නිදහස අඩු කම නිසා ඔහු මුහුණදුන් අසීරුතාවයන් නොතකා ක්‍රෝස් සොයුරා ස්වාමීන්වහන්සේට ප්‍රේමකර සේවය කළ මිනිසෙකි. ඔහු ඇදහිල්ලෙන් යුතුව ඔහුට දුන් සෑම පැවරුමක්ම හිතට එඟගව ඉටු කළේය.

අනෙක් මිනිසා, ජොහාන් ඩෙන්ඩෝෆර්ය, ඔහු හංගේරියානු ජාතිකයෙකි, ජර්මනියේදී සභාවට හැරී විත්, එහිදී 1911දී බව්තීස්මවුනේ වයස 17දීය. ඉන්පසුව වැඩි කල් නොයවා, ඔහු හන්ගේරියාවට නැවත ගියේය. දෙවෙනි ලෝක යුද්ධයට පසුව, ඔහු ඔහුගේම ජන්ම භූමියේ, ඩෙබ්රසන් නගරයේ, සැබවින්ම සිරකරුවෙක්වූ බව ඔහුට පෙනින. හන්ගේරියාවේ ජනතාවගෙන්ද නිදහස ඉවත්කර තිබින.

වෝල්ටර් ක්‍රොස් සොයුරා, ඩෙන්ඩෝෆර් සොයුරා ගැන නොදන සිටියද, ඔහුගේ නිවාස ගුරුවරයා ලෙස ක්‍රමානුකූලව ඔහුව බැහැදැකීමට පැවරුමක් ඔහුට ලැබුනේය. ක්‍රොස් සොහොයුරා ඔහුගේ නිවාස ඉගැන්වීමේ සහායකයාට කථාකර ඔහුට මෙසෙ කීවේය, "අපට ජොහාන් ඩෙන්ඩොෆර් සොයුරා බැහැදකීමට පැවරුමක් ලැබී තිබේ. මේ සතියේ ඔහු බැලීමට ගොස් සුභාරංචි පණිවුඩයක් ඔහුට දීමට මා සමග යාමට වෙලාවක් ඔබට තිබේද?" ඉන්පසුව ඔහු මෙසේද කීවේය, "ඩෙන්ඩොෆර් සොයුරා ජීවත්වන්නේ හන්ගේරියාවේ. "

පුදුමයට පත් ඔහුගේ සහායකයා මෙසෙ ඇසීය, "අපි පිටත්වන්නේ කවදද?"

"හෙට," ක්‍රොස් සොයුරා පිළිතුරු දුන්නේය

"අපි නැවත නිවසට එන්නේ කවදද?" සහායකයා ඇසීය.

ක්‍රොස් සොයුරා මෙසේ පිළිතුරු දුන්නේය, "ඕ, සතියකින් පමණ—අප *නැවත එන විට.* "

නිවාස ඉගැන්වීමේ සහායකයන් දෙදෙනා ඩන්ඩොෆර් සොයුරා බැහැදැකීමට ගියහ, දුම්රියෙන් සහ බසයෙන් ජර්මනියේ

ඊශානදිග ප්‍රදේශයේ සිට හන්ගේරියාවේ ඩෙබ්රසන් වෙත ගමන් කළහ—එය සැළකිය යුතු ගමනකි. ඩෙන්ඩොෆර් සොයුරාට යුද්ධයට පෙර සිටම නිවාස ගුරුවරුන් සිටියේ නැත. දැන්, ඔහු මෙම ස්වාමීන්වහන්සේගේ සේවකයන් දුටු විට, ඔවුන්ගේ පැමිණීම ගැන ඔහු කෘතඥතාවයෙන් යටපත්විය. පළමුව ඔවුන්ට අතට අත දීමට ඔහුට ශක්තියක් නැතිවිය. ඒ වෙනුවට, ඔහු ඔහුගේ නිදන කාමරයට ගොස් කුඩා කැබිනෙට්ටුවෙන් ඔහු වසර ගණනාවක් ඉතිරිකළ ඔහුගේ දසයෙන් කොටස සහිත පෙට්ටියක් ගත්තේය. ඔහු සිය දසයෙන් කොටස ඔහුගේ නිවාස ගුරුවරුන්ට ඉදිරිපත්කර මෙසේ කීවේය, "දැන් මම ස්වාමීන්වහන්සේට සමීපය, දැන් ස්වාමීන්වහන්සේගේ සේවකයන් හා අතට අත දීමට මා සුදුසු යයි මට හැඟේ!" ක්‍රොස් සොයුරා පසුව මට පැවසූ ලෙස, වසර ගණනාවක් සභාව සමග සම්බන්ධයක් නොතිබූ මෙම ඇදහිලිමත් සොයුරා, කීකරුකමින් සහ එකඟකමින් යුතුව ඔහුගේ සුළු ආදායමෙන් ඔහුගේ දසයෙන් කොටස ගෙවීමට සියයට 10ක් ගෙන ඇති බව සිතන විට ඔහුට ඇතිවූ හැඟීම් කීමට වචන නැති බවද කීවේය. ඔහු එය ඉතිරිකර තිබුනේ කවද එය ගෙවීමට වරප්‍රසාදයක් ඔහුට ලැබේදැයි නොදැනය.

වෝල්ටර් ක්‍රොස් සොයුරා, වසර නවයකට පෙර, වයස 94දී මිය ගියේය. ඔහු සිය ජීවිතය මුළුල්ලේම ඇදහිලිමත්ව සහ කීකරුව සේවයකළ අතර, මට සහ ඔහු දැන සිටි සියල්ලන්ටම බලපෑමක්ද විය. පැවරුමක් ඉටුකිරීමට ඇසූ විට ඔහු කිසිද ප්‍රශ්න නොකළේය, ඔහු කිසිද මුණු මුණු ගෑවේ නැත. ඔහු කිසිද සමාවට කරුණු නොකීවේය.

මගේ සොයුරු සොයුරියනි, මේ ජීවිතයේ විශාල පරීක්ෂණය කීකරුකමයි. ඔවුන්ගේ ස්වාමීන්වූ දෙවියන්වහන්සේ ඔවුන්ට නියෝගකරන සියල්ල ඔවුන් කරන්නේදැයි අපි මෙයින් ඔවුන්ට පෙන්වා දෙන්නෙමු. 10

ගැලවුම්කරුවාණෝ මෙසේ කීසේක, මක්නිසාද මගේ හස්තයෙන් ආශිර්වාදයක් ලබන සියල්ලෝ, මෙම ලෝකය පිහිටුවීමට පෙර සිටම ස්ථාපනයකල එම ආශිර්වාදයට නියම කල නීතිය, සහ එහි කොන්දේසි පිළිපදිනෝය. 11

අපගේ ගැලවුම්කරුවාණන් තරම් ශ්‍රේෂ්ඨ උදහරණයක් තවත් නැත, උන්වහන්සේ ගැන පාවුළු මෙසේ කීවේය:

"උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත්, තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙන ගත්සේක. ;

"මෙසේ උන්වහන්සේ සම්පූර්ණකරනු ලැබ, තමන්වහන්සේට කීකරුවන්නාවූ සියල්ලන්ටම සදකාල ගැලවීමේ කර්තෘවූසේක."[12]

ගැලවුම්කරුවාණෝ තමන්වහන්සේට නියමවූ පූජනීය ජීවිතයට අනුව, සම්පූර්ණ ජීවිතයක් ගතකරමින් දෙවියන්වහන්සේගේ අව්‍යාජ ප්‍රේමය පෙන්වූසේක. කිසිදා අහංකාර නොවූසේක. අහංකාරකමින් උඩඟු නොවූසේක. උන්වහන්සේ කිසිද රාජද්‍රෝහී නොවූසේක. සැමදම යටහත් පහත්ව සිටිසේක. සැමදම අවංකව සිටිසේක. උන්වහන්සේ සැමදම කීකරුව සිටිසේක.

රැවටිල්ලේ ස්වාමියා විසින් උන්වහන්සේව පරීක්ෂාකිරීම සඳහා ආත්මයාණන් මගින් කැලයට ගෙන ගියද, දවස් 40ක් සහ රාත්‍රී 40ක් උපවාස කිරීමෙන් උන්වහන්සේ ශාරීරිකව දුර්වලව කුසගින්නේ සිටියද, නපුරා විසින් බොහෝ පොළඹවන සහ ආශාකරන දේවල් යේසුස්වහන්සේට යෝජනා කළද, උන්වහන්සේ දැන සිටි හරි දෙයින් පිට පැනීම ප්‍රතික්ෂේප කර කීකරුකම නම් දිව්‍යමය ආදර්ශය අපට දුන්සේක. 13

ගෙත්සමනියේ කටුක දුක් වේදනාවට මුහුණ දෙමින්, වේදනාව නිසා "උන්වහන්සේගේ දහදිය විශාල ලේ බින්දු මෙන් පොළොවට වැටෙන විට, "14 උන්වහන්සෙ කීකරු පුත්‍රයා ලෙස මෙසේ කියමින් ආදර්ශමත්වූසේක, "පියාණෙනි, ඔබ කැමතිසේක් නම්, මේ කුසලාන මාගෙන් පහකළ මැනව. එසේවී නුමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි කීසේක."15

ගැලවුම්කරුවාණෝ තම පැරණි ප්‍රේරතවරුන්ට උපදෙස් දුන් ලෙස, උන්වහන්සේ ඔබට සහ මටද මෙසේ උපදෙස් දෙනසේක: "නුඹ මා අනුව වරෙන්න"[16] කීකරුවීමට අප කැමතිද?

අප සොයන අවබෝධය, අපි ආශාකරන දේවලට පිළිතුරු, සංකීර්ණ සහ අභියෝගාත්මක ලෝකයක් තුල අභියෝගවලට මුහුණදීමට අද අප සොයන ශක්තිය අපට ලැබෙන්නේ අපි ස්වාමීන්වහන්සේගේ පණත්වලට කැමැත්තෙන්ම කීකරුවන විටය. මම නැවතත් ස්වාමීන්වහන්සේගේ වචන උපුටා දක්වමි:

දේව පණත් ආරක්ෂාකරන්නා සත්‍යයෙන් මහිමවත්වී සියල්ල දැනගන්නා තුරු ඔහු සත්‍යය සහ ආලෝකය ලබන්නේය. 17

මගේ යටහත් පහත් යාච්ඤාව කීකරුවූවන්ට පොරොන්දුවී ඇති ත්‍යාගවලින් අපි ආශිර්වාදිතවීමය. අපගේ ස්වාමීන් සහ ගැලවුම්කරුවාණන්ගේ නාමයෙනි, ආමෙන්.

### සටහන්

1. "Oh Say, What Is Truth?" *ගීතිකා,* අංක. 272.
2. බලන්න දහම සහ ගිවිසුම 93:24, 26–28.
3. 1 සාමුවෙල් 15:22.
4. බලන්න දහම සහ ගිවිසුම 64:34.
5. 1 නෙපී 3:7.
6. උත්පත්ති 22:12.
7. උත්පත්ති 22:18.
8. Joseph F. Smith, "Discourse," *Deseret News*, Nov. 12, 1873, 644.
Joseph F. Smith, address delivered in the New Tabernacle, Salt Lake City, Semiannual Conference, ඔක්තෝ. 7, 1873.
9. Gordon B. Hinckley, "If Ye Be Willing and Obedient," *Ensign,* දෙසැ. 1971, 125.
10. බලන්න ආබ්‍රහම් 3:25.
11. බලන්න දහම සහ ගිවිසුම 132:5.
12. හෙබ්‍රෙව් 5:8–9.
13. බලන්න මතෙව් 4:1–11.
14. ලූක් 22:44.
15. ලූක් 22:42.
16. යොහාන් 21:22.
17. බලන්න දහම සහ ගිවිසුම 93:28.

© 2013 Intellectual Reserve, Inc විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/12. පරිවර්තන අනුමැතිය: 6/12.
First Presidency Message, May 2013 පරිවර්තනයයි. Sinhala 10665 408

## අපගේ කාලය සඳහා ඉගැන්වීම්

හතරවෙනි ඉරුදින මෙල්කිසදෙක් පූජකවරයේ සහ සහන සමිති පාඩම් "අපගේ කාලය සඳහා ඉගැන්වීම්" වලට කැපකර ඇත. එක් එක් පාඩම මෑතකාලීන ප්‍රධාන සම්මන්ත්‍රනයේ කථාවලින් සූදානම්කරගත හැකිය (පහත සඳහන් සටහන බලන්න). පාවිච්චිකළ යුතු කථාව කුමක්දැයි ස්ටේක් සහ දිස්ත්‍රික් සභාපතිවරු තෝරා ගනු ඇත, නැතහොත් මෙම වගකීම ඔවුන් සභානායකවරුන්ට හෝ ශාඛා සභාපතිවරුන්ට පවරනු ඇත. එකම කථාව එකම ඉරුදින අධ්‍යයනයකිරීමේ වටිනාකම ගැන මෙල්කිසදෙක් පූජකවරයේ සොහොයුරන්ට සහ සහන සමිති සොහොයුරියන්ට නායකයන් විසින් අවධාරණයකරනු ලැබේ.

හතරවෙනි ඉරුදින පාඩම්වලට සහභාගිවන අය ප්‍රධාන සම්මන්ත්‍රනය නිතුත්කල නවතම සඟරාව අධ්‍යයනයකර පංතියට රැගෙන ඒමට දිරිගන්වනු ලැබේ.

**කථාවකින් පාඩමක් සදානම්කිරීම සඳහා යෝජනා**

ඔබ කථා (වලින්) ඉගැන්වීමට අධ්‍යයනයකරන විට, ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගැනීම සඳහා යාච්ඤාකරන්න. ඔබ පාඩමට සූදානම්වීමේදී වෙනත් ලිපි යොදාගැනීමට පෙළඹවීම් ඔබට එනු ඇත, නමුත් ප්‍රධාන සම්මන්ත්‍රන කථා අනුමත විෂ්‍ය මාලාවයි. ඔබගේ පැවරුම වන්නේ මෑතකාලීන සම්මන්ත්‍රන කථාවල ඉගැන්වූ ලෙස සුභාරංචිය ඉගෙනගෙන ඒ අනුව ජීවත්වීමට අන් අයට උපකාරකිරීමය.

කථා නැවත බැලීමේදී පංති සාමාජිකයන්ගේ අවශ්‍යතාවයන්ට සරිලන මූලධර්ම සහ දහම සොයන්න. එසේම මෙම සත්‍යයන් ඉගැන්වීම සඳහා අවශ්‍යවන කථාන්තර, ශුද්ධලියවිලි කොටස්, සහ ප්‍රකාශනද සොයන්න.

මූලධර්ම සහ දහම උගන්වන අන්දම ගැන කටුසටහනක් සාදන්න. පංති සාමාජිකයන්ට උපකාරවත්වන ප්‍රශ්න ඇතුල්කිරීම ගැන සලකාබලන්න.

කථාවල මූලධර්ම සහ දහම සොයන්න.

එහි අර්ථය ගැන සිතන්න.

අවබෝධය, අදහස්, අත්දැකීම්, සහ සාක්ෂි බෙදාගන්න.

මෙම මූලධර්ම සහ දහම ඔවුන්ගේ ජීවිතවලට අදාලකරන්න.

උගන්වන මාසික පාඩම්

හතරවෙනි ඉරුදින පාඩම්

අප්‍රේල් 2013-ඔක්තෝබර් 2013

2013 අප්‍රේල් ප්‍රධාන සම්මන්ත්‍රනයේ දුන් කථා

ඔක්තෝබර් 2013-අප්‍රේල් 2014

2013 ඔක්තෝබර් ප්‍රධාන සම්මන්ත්‍රනයේ දුන් කථා

අප්‍රේල් සහ ඔක්තෝබර් හතරවෙනි ඉරුදින පාඩම්, ගතවූ හෝ ඉතා මෑතකාලීන සම්මන්ත්‍රනයෙන් තෝරාගත හැකිය. කථා නොයෙක් භාෂාවලින් ලබාගතහැකිය.

# බැහැදැක ඉගැන්වීමේ පණිවුඩය, මැයි 2013

# "මා වෙතට වරෙල්ලා"

### සභාපති හෙන්රි බී. අයිරින් විසිනි

#### පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා

ක්‍රිස්තුස්වහන්සේ වචනයෙන් සහ ආදර්ශයෙන් උන්වහන්සේ වෙතට සමීපවන අන්දම අපට පෙන්වා ඇතිසේක.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවේ මෙම සම්මන්ත්‍රනයේ ඔබත් සමග සිටීමට ලැබීම ගැන මම කෘතඥවෙමි. අපි උන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වන විට උන්වහන්සේගේ නාමය අප වෙත ගන්නෙමු. උන්වහන්සේ දෙවියන්වහන්සේද මැවුම්කරුවාණන්ද වන අතර, සම්පූර්ණවනද සේක. අපි පව්කිරීමට සහ මරණයට යටත් මැරෙනසුළු අය වන්නෙමු. උන්වහන්සේගේ ප්‍රේමය අපට සහ අපගේ පවුල්වලට ඇති නිසා උන්වහන්සේට සමීපවීමට අපට ආරාධනාකරනසේක. උන්වහන්සේ වෙතට සමීපවීමෙන් උන්වහන්සේ අප වෙතට සමීපවන සේක, උන්වහන්සේව උනන්දුවෙන් සෙවීමෙන් අපට උන්වහන්සේව සොයාගත හැකිය. ඉල්ලීමෙන් ලබාගත හැකිය. තට්ටුකිරීමෙන් අපට විවෘතවනු ඇත. 1

මෙම පාස්කු කාලයේ අප උන්වහන්සේට ප්‍රේමකිරීම ගැන සහ උන්වහන්සේ සිය ඇදහිලිමත් ගෝලයන්ට උන්වහන්සේගේ ආදරණීය මිතුරන් බවට පත්වීමට දුන් පොරොන්දු ගැනත් අපට සිහිපත් කෙරේ. ගැලවුම්කරුවාණෝ එම පොරොන්දුව දී, අප උන්වහන්සේට සේවයකිරීම තුලින්, උන්වහන්සේ අප වෙත එන අන්දම අපට කීසේක. එක් උදාහරණයක් ඔලිවර් කව්ඩරි ජෝසෆ් ස්මිත් සමග මෝර්මන්ගේ පොත පරිවර්තනයකිරීම තුලින් ස්වාමීන්වහන්සේට සේවයකරන විට ලැබුනිඃ ඔහු ඔලිවර් කව්ඩරි බවත්, ඔහු තුල තිබෙන කැමැත්ත නිසා උන්වහන්සේ ඔහුට කථාකල බවත්, මෙම වචන ඔහුගේ හදවතේ අගයකරන ලෙස කීසේක. දෙවියන්වහන්සේගේ පණත් ඇදහිලිමත්ව සහ උනන්දුවෙන් තබන ලෙස සහ උන්වහන්සේ සිය ප්‍රේමයේ අත්වලින් ඔහුව වටකරන බවත් කීසේක, 2

පණත්වලට කීකරුවීමේ සරල ක්‍රියා තුලින් බොහෝ විට ගැලවුම්කරුවාණන් වෙත සමීපවීම සහ උන්වහන්සේ මා වෙත සමීපවීමේ සතුට මම අත්දුටුවෙමි.

එවන් අත්දැකීම් ඔබටත් ලැබී ඇත. එය සක්‍රමේන්තුවට සහභාගිවීම ඔබ තෝරාගන්නා විට වියහැකිය. මා ඉතා කුඩා කාලයේ සබත් දිනෙක මට එය ලැබින. ඒ කාලයේ අප සක්‍රමෙන්තුව ලබාගත්තේ සවස රැස්වීමේදීය. මතකය අනුව වසර 65කටත් වඩා පෙර එක් දිනක්, මා මගේ පවුල සහ ශුද්ධවන්තයන් සමග එකතුවීමේ පණත තැබීමෙන්, මා තවමත් ගැලවුම්කරුවාණන් වෙතට සමීපකරවයි.

එදින පිටත අඳුර සහ ශීතල පැවති දිනයකි. එදින සවස මාගේ දෙමාපියන් සමග සිටියදී ආලෝකය සහ උණුසුම දේවස්ථානය තුල හැඟුන බව මට මතක ඇත. ස්වර්ගික පියාණන්වහන්සේගේ පුත්‍රයාණන් නිතර සිහිකර, උන්වහන්සේගේ පණත් තබන බවට ගිවිසුම්කරමින්, ආරෝනික පූජකවරය උසුලන්නන් විසින් මෙහෙයවනු ලැබූ, සක්‍රමේන්තුව අපි ලබාගත්තෙමු.

රැස්වීම අවසානයේදී අපි "Abide with Me; 'Tis Eventide," ගීතිකාවේ, මෙම වචන ගායනා කළෙමු, "අහෝ ගැලවුම්කරුවාණෙනි, මේ රාත්‍රියේ මා සමග සිටිනු මැන"3

ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය සහ සමීපතාවය එම සැන්දෑවේදී මට හැඟින. එසේම ශුද්ධාත්මයාණන්ගේ සැනසීමද මට හැඟින.

මා තරුණ කාලයේදී එම සක්‍රමේන්තු කාලය තුලදී මට හැඟුන ගැලවුම්කරුවාණන්ගේ ප්‍රේමය සහ උන්වහන්සේගේ සමීපතාවය ගැන හැඟීම නැවත දැල්වීමට මට අවශ්‍යවේ. මෑතකදී මම තවත් පණතක් තැබුවෙමි. මම ශුද්ධ ලියවිලි තුල සෙව්වෙමි. නැවත නැගිටුන ස්වාමීන්වහන්සේගේ ගෝලයන් දෙදෙනා ඔවුන්ගේ නිවසට පැමිණ ඔවුන් සමග සිටින ලෙස උන්වහන්සේට කල ආරාධනාව උන්වහන්සේ පිළිගත්විට ඔවුන්ට හැඟුන හැඟීම් මටද නැවතත් ශුද්ධාත්මයාණන් තුලින් ලබාගැනීමට හැකි බව මම දැනසිටියෙමි.

උන්වහන්සේගේ කුරුසප්ප්‍රාප්තිය සහ භූමදානයෙන් පසුව තුන්වන දවස ගැන මම කියෙව්වෙමි. ඇදහිලිමත් කාන්තාවන් සහ අන් අයට දක්නට ලැබුනේ ගල ඉවතට පෙරළාදමා ඇති බවත් උන්වහන්සේගේ ශරීරය එහි නැති බවත්ය. ඔවුන් පැමිණ තිබුනේ උන්වහන්සේට තිබූ ප්‍රේමය නිසා උන්වහන්සේගේ ශරීරය ආලේපකිරීමටය.

දේවදූතයන් දෙදෙනෙක් ඔවුන් බිය පත්වන්නේ මන්දැයි අසා, මෙසේ කීහඃ

"ජීවත්ව සිටින තැනැත්තා මළවුන් අතරේ නුඹලා සොයන්නේ මක්නිසාද?

"උන්වහන්සේ මෙහි නැත, උන්වහන්සේ නැගිටනසේකඃ උන්වහන්සේ ගලීලයේ සිටියදී කථාකල හැටි සිහිකරපල්ලා,

"මනුෂ්‍ය පුත්‍රයා පව්කාර මිනිසුන්ගේ අත්වලට පාවාදෙනු ලබන්ටත්, කුරුසියෙහි ඇණගසනු ලබන්ටත්, තුන්වෙනි දින නැවත නැගිටින්ටත් ඕනෑබවයි."4

එක් දේවදූතයෙකුගේ ප්‍රකාශයක් මාර්ක්ගේ ශුභාරංචියේ ඇතුලත්ව ඇතඃ "නුමුත් නුඹලා ගොස්ඃ උන්වහන්සේ නුඹලාට පළමුවෙන් ගලීලයට යන සේකයි කියාත්, උන්වහන්සෙ නුඹලාට කී ලෙස එහිදී නුඹලා උන්වහන්සේ දකිනවා ඇත කියාත් උන්වහන්සේගේ ගෝලයන්ටද පේත්‍රුස්ටද කියාපල්ලා."5

ප්‍රේරිතවරුන් සහ ගෝලයන් යෙරුසලමේ එකට එකතුවී ඇත. අප මෙන් ඔවුන්ද බියට පත්ව එකට එක්ව කථාකරන විට මරණය සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ පුවත්වල අරුත කුමක්දැයි කල්පනා කරන්ට ඇත.

ගෝලයෝ දෙදෙනෙක් එදින දහවලේ යෙරුසලමේ සිට එම්මාවුස් මාර්ගයේ ගමන් කළහ. නැවත නැගිටිනු ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශවී මාර්ගයේ ඔවුන් සමග ගමන්කළහ. ස්වාමීන්වහන්සේ ඔවුන් වෙත පැමිණ ඇතිසේක.

ලූක්ගේ පොතේ ඔවුන් සමග යාමට අපටද අවසර දෙයිඃ

"තවද ඔවුන් කථාකරමින් විචාරමින් සිටියදී, යේසුස්වහන්සේම ඔවුන් ලඟට පැමිණ ඔවුන් සමග ගියසේක.

"නුමුත් ඔවුන් උන්වහන්සේ නාඳුනන ලෙස ඔවුන්ගේ ඇස් බැඳී තිබුනේය.

"උන්වහන්සේ ඔවුන්ට කථා කොටඃ නුඹලා කථාකරකර යන්නාවූ මේ කාරණා මොනවාදැයි ඔවුන්ගෙන් ඇසූසේක.

"ඔවුනගෙන් ක්ලයෝපස් නම් එක්කෙනෙක් උන්වහන්සේට උත්තරදෙමින්ඃ මේ දවස්වලදී යෙරුසලමේ විදේශීව සිටිමින් එහි සිදුවූ කාරණා නොදන්නේ නඹ පමණක්දැයි උන්වහන්සේට කීවේය ?"6

ඔවහු සිය ශෝකය උන්වහන්සේට ප්‍රකාශ කොට, යේසුස්වහන්සේ මියගිය බවත් උන්වහන්සේ ඉශ්‍රායෙල්ගේ මිදුම්කරුවාණන්බව ඔවුන් විශ්වාසකළ බවත් කීහ.

නැවත නැගිටුනු ස්වාමීන්වහන්සේ මෙම දුකින් ශෝකයට පත් ගෝලයන් දෙදෙනාට කථාකරන විට උන්වහන්සේගේ කටහඬෙහි යම් ආදරයක් තිබෙන්ට ඇතඃ

"එවිට උන්වහන්සේ ඔවුන්ට කියනසේක්, අඥානයෙනි, අනාගතවක්තෘවරුන් විසින් කියන ලද සියල්ල විශ්වාසකරන්ට ප්‍රමාද සිත් ඇත්තෙනිඃ

" ක්‍රිස්තුස්වහන්සේ ඒ දේ විඳලාම ස්වකීය මහිමයට පැමිණෙන්ට යුතුව තිබුනා නොවේද?

"මෝසෙස්ගෙන්ද, සියලු අනාගතවක්තෘවරුන්ගෙන්ද පටන්ගෙන, සියලු ලියවිලිවල තමන් ගැන තිබුන කාරණා ඔවුන්ට තෝරාදුන්සේක."7

ඉන්පසුව පැමිණි මොහොත මා කුඩා ළමයෙක්ව සිටි කාලයේ සිටම මාගේ හදවත උණුසුම් කළේයඃ

"ඔවුහු යන්ට ගිය ගමට ළංවූවෝය. උන්වහන්සේ වනාහ වඩා දුර යන්නාක් මෙන් දැක්වූසේක.

"නුමුත් ඔවුහුඃ දවස බොහෝ ගතවී, සවස්වේගෙන එන බැවින්, අප සමග නැවතුන මැනව කියා, උන්වහන්සේට උදක්ම පෙරැත්ත කළෝය."8

ගැලවුම්කරුවාණෝ එදින රාත්‍රී එම්මාවුස් ගමේ උන්වහන්සේගේ ගෝලයන්ගේ නිවසට ඇතුල්වීමට කල ආරාධනය පිළිගත්සේක.

උන්වහන්සේ ඔවුන් සමග කෑමමේසයට වාඩිවූහ. උන්වහන්සේ පාන් කඩා ඔවුන්ට දුන්සේක. ඔවුන්ගේ ඇස් ඇරී, උන්වහන්සේව ඔවුහු ඇඳිනගත්හ. ඉන්පසුව උන්වහන්සේ ඔවුන්ට නොපෙනී ගියහ. එම ආශිර්වාදිත ගෝලයන්ගේ හැඟීම් ගැන ලූක් අපට මෙසේ වාර්තාකරයිඃ "එකල ඔවුහු උන්වහන්සේ අප සමග මගදී කථාකල කල්හිත්, ලියවිලි අපට තෝරාදුන් කල්හිත්, අපේ සිත් දැවා නොවේදැයි එකිනෙකාට කථාකර ගත්තෝය?"9

එම පැයේදීම, ගෝලයන් දෙදෙනා තමන්ට සිදුවූ දේ ගැන ප්‍රේරිතවරුන් එකොලොස්දෙනාට කීම සඳහා යෙරුසලමට වහා ගියහ. එම මොහොතේ ගැලවුම්කරුවාණෝ නැවතත් ප්‍රකාශවූසේක.

උන්වහන්සේගේ දූතමෙහෙය වනාහි සිය පියාණන්ගේ දරුවන්ගේ පාපවලට වන්දිගෙවීම සහ මරණයේ බැම් බිඳදැමීම බවට අනාවැකි නැවත කීසේක.

" ඔවුන්ට කියනසේක්, මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත් තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත්ඃ

" යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ.

"නුඹලා මේ දේවලට සාක්ෂිකාරයෝය."10

ගැලවුම්කරුවාණන්ගේ වචන එදා උන්වහන්සේගේ ගෝලයන්ට මෙන් අපටද සත්‍යවේ. අපි මේ දේවලට සාක්ෂිකාරයෝ වෙමු. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල ශුද්ධවන්තයන්ගෙන් යුත් සභාවට අපි බව්තීස්මවූ විටදී බාරගත් එම මහිමාන්විත වගකීම අනාගතවක්තෘ ඇල්මා ශතවර්ෂ ගණනාවකට ඉහතදී මෝර්මන් ජලාශය අසලදී අපට සරලව පැහැදිලිකළේයඃ

"තවද එය මෙසේ සිදුවිය, එනම් ඔහු ඔවුන්හට මෙසේ කියමින්ඃ බලන්න, මෝර්මොන්හි ජලය මෙහිය (මක්නිසාද එය නම්කරනු ලැබුවේ එසේය) තවද දැන්, නුඹලා දෙවියන්වහන්සේගේ රැළ තුලට පැමිණීමට ආශාවන්නෙහුය. තවද උන්වහන්සේගේ ජනතාව ලෙස නම්කරනු ලැබීමටද, එනම් ඒවා සැහැල්ලුවන පිණිස, එකිනෙකාගේ බර ඉසිලීමට කැමැත්තද;

"එසේය, ශෝකවන්නන් සමග ශෝකවීමට කැමැත්තද; එසේය, තවද සැනසිල්ල අවශ්‍යවන්නන් උදෙසා නැගීසිට සැනසීමටද, තවද සියලු කාලයන්හිද, සියලු දේවල් තුලෙහිද, තවද නුඹ සිටින්නාවූ සියලු ස්ථානයන්හි මරණය දක්වා වුවත්, දෙවියන්වහන්සේට සාක්ෂියක්ව නැගීසිටීමටද, එනම් නුඹලා දෙවියන්වහන්සේ විසින් මුදනු ලැබීමටද, තවද පළමු නැවත නැගිටීමේ අයවලුන් සමග ගණන්ගනු ලැබීමටද එනම් නුඹලාට සදාතන ජීවිතය ලබාගැනීමටය—

"දැන් මම නුඹලාට කියන්නෙමි, නුඹලාගේ හදවත්වල කැමැත්ත මෙය නම්, ස්වාමීන්වහන්සේගේ නාමය තුල බව්තීස්මවීමට කුමක් නුඹලාට විරුද්ධව තිබේද? උන්වහන්සේ ඉදිරියේ සාක්ෂියක්ව එනම්, නුඹලා විසින් උන්වහන්සේට සේවයකිරීමටත්, තවද උන්වහන්සේගේ ආඥාවන් පැවැත්වීමටත්, එනම් උන්වහන්සේ උන්වහන්සේගේ ආත්මය නුඹලා වෙතට බොහෝ අධික ලෙස වැගිරවීමටත්, නුඹලා උන්වහන්සේ සමග ගිවිසුමකට ඇතුළත්වී ඇත්තෙහුද?

"තවද දැන් ජනතාව මෙම වචන ඇසූවිට, ඔවුන් ප්‍රීතියෙන් අත්පොලසන් දෙමින්, තවද කෑගැසුවෝය. අපගේ හදවත්වල ආශාව මෙයයි. "11

අප ජීවත්වනතාක් කල්, අවශ්‍යතා ඇති අය ඔසවාතැබීමට සහ ගැලවුම්කරුවාණන් ගැන සාක්ෂියක්ව සිටීමට අපි ගිවිසුම් කර සිටින්නෙමු.

අපට එය නොවැරදීම කල හැක්කේ ගැලවුම්කරුවාණන්ට අපගේ ප්‍රේමය සහ උන්වහන්සේගේ ප්‍රේමය අපටද හැඟුනවිට පමණය. අප දුන් පොරොන්දුවලට අප ඇදහිලිමත්වන විට, උන්වහන්සේට අප දක්වන ප්‍රේමය අපට හැඟේ. එය වැඩිවන්නේ අපට උන්වහන්සේගේ බලය හැඟීම නිසා සහ උන්වහන්සේට සේවයකිරීම තුලින් උන්වහන්සේ අපට ළංවන නිසාය.

ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ඇදහිලිමත් ගෝලයන්ට දුන් පොරොන්දු සභාපති තෝමස් එස්. මොන්සන් අපට නිතර සිහිපත්කර ඇත. අපව ලබාගන්නා අය අසල උන්වහන්සේද සිටිනසේක, මක්නිසාද උන්වහන්සේ අප ඉදිරියෙන් යන නිසාය, උන්වහන්සෙ අපගේ දකුණු පාර්ශවයේ සහ වම් පාර්ශවයේ සිටිනසේක, උන්වහන්සේගේ ආත්මය අපගෙ හදවතේ තිබෙන  අතර, උන්වහන්සේගේ දේවදූතයන් අප දරාසිටීමට අප වටා සිටිනු ඇත. 12

උන්වහන්සේ අපට සමීපවීම වර්ධනයවීම ඔබට සහ මට හැඟෙන තවත් මාර්ගයක් ඇත. අප උන්වහන්සේට භක්තිමත්ව සේවයකරන විට, අප ප්‍රේමකරන අපගේ පවුල්වල අය වෙත උන්වහන්සේ සමීපවනසේක. මගේ පවුල හා සමග හෝ හැර ස්වාමීන්වහන්සේගේ සේවයට මා කැඳවූ සෑම අවස්ථාවකම ස්වාමීන්වහන්සේ මගේ බිරිඳ සහ දරුවන්ට ආශිර්වාදකරන බව මා දැක ඇත. උන්වහන්සේගේ ආදරණීය සේවකයන්ව සහ මගේ පවුලේ අය උන්වහන්සේට සමීපකරන අවස්ථාවන් උන්වහන්සේ සූදානම්කරනසේක.

එම ආශිර්වාදම ඔබගේ ජීවිතයේදී ඔබට හැඟී ඇත. සදාකාලික මාර්ගයෙන් පිටත මංමුලාවූ ආදරවන්තයන් ඔබ බොහෝ දෙනෙකුට ඇත. ඔවුන්ව නැවත ගෙනඒමට ඔබට තවත් කළ හැකි දේවල් ගැන ඔබ කල්පනාකරනු ඇත. ඔබ ඇදහිලිමත්ව ස්වාමීන්වහන්සේට සේවයකරන විට ඔවුන් වෙත සමීපවීමට උන්වහන්සේ මත විශ්වාසය තැබීමට ඔබට පුළුවන.

ජෝසෆ් ස්මිත් සහ සිඩ්නි රිග්ඩන් ස්වාමීන්වහන්සේගේ කටයුතු සඳහා පිටත්ව ගිය විට  ස්වාමීන්වහන්සේ ඔවුන්ට දුන් පොරොන්දු ඔබට මතක ඇත. උන්වහන්සේගේ මිතුරන්වන සිඩ්නි සහ ජෝසෆ්ගේ පවුල් හොඳින් සිටින බවත්, ඔවුන් උන්වහන්සේගේ හස්තයේ බව සහ උන්වහන්සේට යහපත් ලෙස පෙනෙන දේ ඔවුන්ට කරන බවත්, උන්වහන්සේට ඒ

සඳහා බලය තිබෙන බවත් උන්වහන්සේ කීසේක. 13

ඇල්මා සහ මොසායා රජතුමා මෙන්, දීර්ඝකාලයක් ස්වාමීන්වහන්සේට හොඳින් සේවයකළ සමහර ඇදහිලිමත් දෙමාපියන්ගේ පරිත්‍යාග නොතකා හැර මංමුලාවූ දරුවන් ඔවුන්ට සිට ඇත. ඔවුන් තමන්ට හැකි සියල්ල කළද, ප්‍රේමනීය සහ ඇදහිල්මත් මිතුරන්ගේ උපකාරවලින් පවාද, ප්‍රයෝජනයක් නොවීය.

ඇල්මා සහ ඔහුගේ කාලයේ ශුද්ධවන්තයෝ ඔහුගේ පුත්‍රයා සහ මොසයා රජතුමාගේ පුතුන් උදෙසා යාච්ඤා කළහ. දේවදූතයෙක් පැමිණියේය. ඔබගේ යාච්ඤා සහ සිය ඇදහිල්ල ක්‍රියාත්මක කළ අයගේ යාච්ඤාද මගින් ඔබගේ පවුල් සමාජිකයන්ට උපකාරකිරීමට ස්වාමීන්වහන්සේගේ සේවකයන් ගෙන එනු ඇත. සාතන් සහ ඔහුගේ අනුගාමිකයන් ඔවුන්ට පහරදුන්නද, මෙම ජීවිතයේදී සහ සදාකාලිකවම පවුල් විනාශකරීම ඔවුන්ගේ අරමුණ වුවද, දෙවියන්වහන්සේගේ නිවසට යන මාර්ගය තෝරාගැනීමට ඔවුන් උදව්කරනු ඇත.

බාල ඇල්මා සහ මොසායාගේ පුත්‍රයෝ කැරළිගැසීමේදී දේවදූතයා කථාකල වචන ඔබට මතක ඇත: "තවද නැවතත්, දේවදූතයා කීවේය: බලන්න, ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ සෙනගගේ යාච්ඤාවන් ඇසූසේක. තවද එසේම උන්වහන්සේගේ සේවකයාවූ, නුඹගේ පියාවූ ඇල්මාගේ යාච්ඤාද ඇසූසේක; මක්නිසාද ඔහු නුඹ සම්බන්ධව බලවත් ඇදහිල්ලකින් යාච්ඤාකොට එනම් නුඹ සත්‍යයේ දැනගැන්මට පැමිණවීමට කැමතිවිය; එසේහෙයින් මක්නිසාද මෙම කාරණය හෙයින් දෙවියන් වන්සේගේ බලය සහ අධිකාරීත්වය නුඹට ඒත්තුගැන්වීමට මම පැමිණියෙමි. එනම් උන්වහන්සේගේ සේවකයන්ගේ යාච්ඤාවන්ට ඔවුන්ගේ ඇදහිල්ලට අනුව උත්තරදීම පිණිසය."14

මගේ පොරොන්දුව නම් ස්වාමීන්වහන්සේට යාච්ඤාකරමින් සේවයකරන ඔබට ඔබ කැමති සියලු ආශිර්වාද ඔබට සහ ඔබගේ පවුලටම නොවිය හැකිය. නමුත් මා ඔබට පොරොන්දුවන්නේ, ගැලවුම්කරුවාණන් ඔබට සමීපවී, ඔබට සහ ඔබගේ පවුලට හොඳම අන්දමින් ආශිර්වාදකරන බවය. ඔබට උන්වහන්සේගේ ප්‍රේමයේ සැනසිල්ල ලැබී, ඔබ ඔබගේ අත් අන් අයට සේවය සඳහා දිගුකරන විට, උන්වහන්සේ ඔබට සමීපවීම පිළිතුරු ලෙස ඔබට හැඟෙනු ඇත. අවශ්‍යතා ඇති අයගේ තුවාල ඔබ බඳින විට, පාපයේ දුකින් සිටින අයට උන්වහන්සේගේ වන්දිගෙවීමේ පිරිසිදුකිරීම පිරිනමනවිට, ස්වාමීන්වන්සේගේ බලය ඔබව දරාසිටිනු ඇත. උන්වහන්සේගේ හස්ත ඔබගේ අත් සමග පිටතට දිගුකර ස්වර්ගික පියාණන්ගේ දරුවන්ට, ඔබගේ පවුලේ අයද ඇතුළුව, ආධාරකර ආශිර්වාදකරන ඇත.

ඔබ වෙනුවෙන් මහිමාන්විත නිවසට පැමිණීමක් සූදානම්කර ඇත. අපි ප්‍රේමකළ ස්වාමීන්වහන්සේගේ පොරොන්දුව ඉෂ්ටවීම එවිට අපි දකින්නෙමු. උන්වහන්සේ සහ අපගේ ස්වර්ගික පියාණන් සමග සදාකාලික ජීවනය තුලට අපව පිළිගනු ලබන්නේ උන්වහන්සේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එය මෙලෙස විස්තර කරනසේකඃ

උන්වහන්සේගේ සයෝනය ඉදිරියට ගෙන එමින් එය ගොඩනැගීමට සොයමින්, සෑම දෙයක් තුලෙහිම උන්වහන්සේගේ පණත් තබන්න.

තවද අපි උන්වහන්සේගේ පණත් තබමින් අවසානය දක්වා දරාගන්නේ නම්, අපට සදාකාල ජීවනය ලැබෙනු ඇත. එම දීමනාව දෙවියන්වහන්සේගේ සියලුම දීමනාවලටත් වඩා ශ්‍රේෂ්ඨතම දීමනාවයි. 15

මක්නිසාද ජීවත්වන්නෝ පොළොව උරුමකරගනු ඇති අතර මියයන්නෝ ඔවුන්ගේ සියලු කරදරවලින් නිදහස්වී, ඔවුන් කළ දේවල් ඔවුන් පස්සේ එනු ඇත. තවද ඔවුන් පියාණන්ගේ මාළිගාවල ඔටුන්න ලබාගන්නා අතර, එය ඔවුන් වෙනුවෙන් ස්වාමීන්වහන්සේ සූදානම්කර ඇතිසේක. 16

ස්වර්ගික පියාණන්වහන්සේගේ ආරාධනාව ආත්මයාණන් මගින් අනුගමනයකිරීමට අපට හැකිබවට මම සාක්ෂිදරමිඃ මේ මාගේ ආදරණීය පුත්‍රයාණන්ය, උන්වහන්සේට සවන්දෙන්න! 17

උන්වහන්සේගේ වචන සහ උන්වහන්සේගේ ආදර්ශය මගින්, ක්‍රිස්තුස්වහන්සේ වෙතට ලඟාවන අන්දම උන්වහන්සේ අපට පෙන්වා ඇතිසේක. බව්තීස්මය නම් දොරටුව තුලින් උන්වහන්සේගේ සභාවට ඇතුල්වීම තෝරාගත් ස්වර්ගික පියාණන්ගේ සෑම දරුවෙක්ටම, උන්වහන්සේගේ සුභාරංචිය ඉගෙනගැනීමට සහ උන්වහන්සේ කැඳවූ සේවකයන්ගෙන් උන්වහන්සේගේ ආරාධනාව ඇසීමට මෙම ජීවිතයේදී අවස්ථාව ඇත, "මා වෙතට වරෙල්ලා"18

උන්වහන්සේගේ පොළොව මත රාජධානිය සහ ආත්මික ලෝකය තුල ගිව්සුම්කල උන්වහන්සේගේ සෑම සේවකයෙක්ම ආශිර්වාදකරමින් උන්වහන්සේ වෙනුවෙන් අන් අයට සේවයකරන විට, ආත්මයාණන් මගින් උන්වහන්සේගේ උපදෙස් ලබනු ඇත. තවද ඔවුන්ට උන්වහන්සේගේ ප්‍රේමය හැඟී උන්වහන්සේ වෙතට සමීපවීමේ සතුටද ලැබෙනු ඇත.

එම්මාවුස් මාර්ගයේ එම නිවස තුල එම සැන්දෑවේ ගෝලයන් දෙදෙනා සමග මාද සහතිකවම එතැන සිටියේ නම් ස්වාමීන්වහන්සේගේ නැවත නැගිටීමට මමද සාක්ෂිකරුවෙක්මි, ජෝසෆ් ස්මිත් එක් මනරම් උදෑසනක ආලෝකය තුලින් තුරු වදුලක් තුලදී පියාණන් සහ පුත්‍රයාණන් දුටු ලෙස සහතිකවම උන්වහන්සේ ජීවමාන බව මම දනිමි.

මෙය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍ය සභාවයි. පූජකවරයේ යතුරු සභාපති තෝමස් එස්. මොන්සන් දරාසිටියි. එය අපට පවුල් ලෙස සදාකාලිකවම අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමග ජීවත්වීම සඳහා මුද්‍රාවීමේ බලයයි. අපි විනිශ්චය දවසේ ගැලවුම්කරුවාණන් ඉදිරියේ මුහුණට මුහුණ සිටගන්නෙමු. එය මෙම ජීවිතයේදී උන්වහන්සේගේ සේවය තුලින් උන්වහන්සේට සමීපවූ අයගේ ප්‍රීතිමත්වීමේ කාලයයි. මෙම වචන ඇසීම මහත් සතුටක් වනු ඇතඃ"යහපත්වූ විශ්වාසවූ දාසය. ඒ යහපත."19 මා එසේ සාක්ෂිදරන්නේ, නැවත නැගිටුන ගැලවුම්කරුවාණන් සහ අපගේ මිදුම්කරුවාණන්ගේ සාක්ෂිකරුවෙකු ලෙසය, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙනි, ආමෙන්.

## සටහන්

1. බලන්න දහම සහ ගිවිසුම 88:63.
2. බලන්න දහම සහ ගිවිසුම 6:20.
3. "Abide with Me; 'Tis Eventide," *ගීතිකා*, අංක. 165.
4. ලූක් 24:5–7.
5. මාර්ක් 16:7.
6. ලූක් 24:15–18.
7. ලූක් 24:25–27.
8. ලූක් 24:28–29.
9. ලූක් 24:32.
10. ලූක් 24:46–48.
11. මොසායා 18:8–11.
12. බලන්න දහම සහ ගිවිසුම 84:88.
13. බලන්න දහම සහ ගිවිසුම 100:1.
14. මොසායා 27:14.
15. බලන්න දහම සහ ගිවිසුම 14:6–7.
16. බලන්න දහම සහ ගිවිසුම 59:2.
17. බලන්න ජෝසෆ් ස්මිත්—ඉතිහාසය 1:17.
18. මතෙව් 11:28.
19. මතෙව් 25:21.

© 2013 Intellectual Reserve, Inc විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/12. පරිවර්තන අනුමැතිය: 6/12. Visiting Teaching Message, May 2013 පරිවර්තනයයි.
Sinhala 10665 408